# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2371/35 - 2024 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 1/2012(VI)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩග්ලස් දේවානන්දා,<br>ධීවර අමාත්‍ය.

2024 පෙබරවාරි මස 06 වැනි දින,<br>කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග "2024 මඩ කකුළුවන් ධීවර කළමනාකරණ නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල සඳහන් විධිවිධාන ශ්‍රී ලංකා ජලතීරයෙහි ස්වභාවික මඩ කකුළුවන් ඇල්ලීමේ මඩ කකුළුවන් ධීවර මෙහෙයුම් සඳහා අදාළ විය යුතු ය.

3. යම් තැනැත්තකු විසින්, 1996 නොවැම්බර් 07 දින අංක 948/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1996 ධීවර මෙහෙයුම් නියෝගවලට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නිකුත් කරනු ලැබූ වලංගු මෙහෙයුම් බලපත්‍රයක් යටතේ හැර ශ්‍රී ලංකා ජලතීරයේ මඩ කකුළුවන් ඇල්ලීමේ ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.

4. යම් තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ දක්වා ඇති රූප සටහන පරිදි මඩ කකුළුවාගේ බාහිර කවචයේ වැඩිම පළල ඇති කොටස මැනීමේ දී බාහිර කවචයේ පළල මිලිමීටර් 130 ට අඩු මඩ කකුළුවන් ඇල්ලීම, විකිණීම, සන්තකයේ තබා ගැනීම, පිරිසැකසුම් කිරීම හෝ අපනයනය කිරීම සිදු නොකළ යුතුය.

5. යම් තැනැත්තකු විසින්, බිත්තර සහිත (බිජු දරන) මඩ කකුළුවන් ඇල්ලීම, විකිණීම, සන්තකයේ තබා ගැනීම, පිරිසැකසුම් කිරීම, අපනයනය කිරීම හෝ බිත්තර ඉවත් කිරීම සිදු නොකළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. දැල්වලට හෝ වෙනත් ධීවර ආම්පන්නවලට හසුවන පළල මිලිමීටර් 130 ට අඩු බාහිර කවචයක් සහිත මඩ කකුළුවන් සහ බිත්තර සහිත (බිජු දරන) මඩ කකුළුවන් සජීවී තත්ත්වයෙන් නිදහස් කළ යුතුය.

7. අමාත්‍යවරයා විසින්, අවශ්‍යතාව අනුව හෝ සෑම වසර තුනකට වරක්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ නිර්දේශ මත, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 34 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන දැන්වීමක නිශ්චිතව සඳහන් ප්‍රදේශවල කකුළුවන් ඇල්ලීම සඳහා සංවෘත වාරයක් සහ විවෘත වාරයක් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

8. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අවශ්‍යතාව අනුව හෝ සෑම වසර තුනකට වරක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ නිර්දේශ මත, එවැනි විවෘත වාරයක් තුළ ඇල්ලීම සඳහා ඉඩ ලබාදෙන මඩ කකුළුවන්ගේ ශරීර ප්‍රමාණය තීරණය කළ යුතුය.

9. යම් තැනැත්තකු විසින් මඩ කකුළුවන් ඇල්ලීමේ දී මුහුදු පතුල හෝ වාසස්ථානයන්හි ඉවුරු හැරීම හෝ හානි කිරීම සිදු නොකළ යුතු ය.

10. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කලින් කලට මඩ කකුළුවන් ඇල්ලීමේ නිරත ධීවරයන්ගෙන්, මඩ කකුළුවන් එකතු කරන්නන් සහ මඩ කකුළුවන් අපනයනය කරන්නන්ගෙන් නිෂ්පාදන දත්ත, අපනයන දත්ත හෝ මඩ කකුළුවන් ඇල්ලීම සම්බන්ධ වෙනත් යම් දත්ත සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

11. මේ නියෝගවල -

"මඩ කකුළුවන්" යන්නෙන්, ශ්‍රී ලංකා ජල තීරයේ වාසය කරන (*Scylla seratta*) යන ජීවී විශේෂය අදහස් වේ;


ස්වභාවික මඩ කකුළුවන්" යන්නෙන්, ජලජීවී වගා මඩ කකුළුවන් හැර ස්වභාවික පරිසරයේ ස්වභාවිකව බෝවන මඩ කකුළුවන් අදහස් වේ;

"පිරිසැකසුම් කිරීම" යන්නෙන්, විකිණීම හෝ අපනයනය කිරීමේ කාර්ය සඳහා තැම්බීම, බාහිර කවචය ඉවත් කිරීම, අතුණු බහන් සහ කරමල් ඉවත් කිරීම, කැපීම හෝ කකුළුවාගේ මාංශ ඉවත් කිරීම අදහස් වේ;

"බාහිර කවචයේ පළල" යන්නෙන්, මෙහි උපලේඛනයේ දක්වා ඇති රූප සටහන පරිදි බාහිර කවචයේ වැඩීම පළල ඇති ස්ථානයේ ලක්ෂ්‍යයන් දෙක අතර ඇති දිග අදහස් වේ.

### උපලේඛනය

[4 වන නියෝගය]




EOG 02 - 0110